# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2253/12 - 2021 නොවැම්බර් මස 09 වැනි අඟහරුවාදා - 2021.11.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත ( 460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : කොප්‍රාලේ/ඉඅත්/3/88/UDA.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/12/2014/UDA.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:-*

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බිලුමැන්ඩල් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාදම්පිටිය (කොට්ඨාස අංක 6) කොළඹ මහනගර සභා සීමාවට අයත් මාදම්පිටිය ගමේ පිහිටි සර්වේ ජනරාල්ගේ අංක 9966 හා 2021.10.22 දිනැති මුලික පිඹුරේ කැබලි අංක 1-3 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.1581ක පමණ වපසරියකින් යුතු වන වරිපනම් 478/6/A, කේ. සිරිල් සී පෙරේරා මාවතේ පිහිටි ඉඩම.

**කැබලි අංක 01**
ඉඩමේ නම: 478/6A, කේ. සිරිල් සී. පෙරේරා මාවත; හිමිකම් කියන්නා: රජය; මුල්හිමිකම්පාන්නා: රජය; වරිපනම් අංක: 478/6A; වර්තමාන පරිහරණය: වත්ත, පොදු කටයුතු සහ ආගමික කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියට අවශ්‍යව ඇත. බිලුමැන්ඩල් සාම විහාරස්ථානය භුක්ති විඳියි; ප්‍රමාණය: හෙක්. 0.0055

**කැබලි අංක 02**
ඉඩමේ නම: 478/6A, කේ. සිරිල් සී. පෙරේරා මාවත; හිමිකම් කියන්නා: රජය; මුල්හිමිකම්පාන්නා: ඒ. ඩබ්. ගුණසේකර 278 බටදොඹතුඩුව පාර, අළුබෝමුල්ල, පානදුර; වරිපනම් අංක: 478/6A; වර්තමාන පරිහරණය: ගෙවත්ත ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් බෝධිය සහ චෛත්‍යයක කොටසක් ඇත; ප්‍රමාණය: හෙක්. 0.0476

**කැබලි අංක 03**
ඉඩමේ නම: 478/6A, කේ. සිරිල් සී. පෙරේරා මාවත; හිමිකම් කියන්නා: රජය; මුල්හිමිකම්පාන්නා: ඒ. ඩබ්. ගුණසේකර 278 බටදොඹතුඩුව පාර, අළුබෝමුල්ල, පානදුර; වරිපනම් අංක: 478/6A; වර්තමාන පරිහරණය: ගෙවත්ත ස්ථිර ගොඩනැගිලි 02ක් ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් චෛත්‍යයක කොටසක් සහ වැසිකිළියක් ඇත. පොදු කටයුතු සහ ආගමික කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියට අවශ්‍යව ඇත. බිලුමැන්ඩල් සාම විහාරස්ථානය භුක්ති විඳියි; ප්‍රමාණය: හෙක්. 0.1050

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ




*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2021 නොවැම්බර් මස 30 වැනි දින පෙරවරු 10.00 ට කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2021 නොවැම්බර් මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/පරවශතාවය සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් ඒකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

නාලක රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,

2021 නොවැම්බර් මස 05 වැනි දින,
කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11 - 521

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.